ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන අංශය

නීතිවේදී උපාධි පාඨමාලාව – සයවන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

අන්තර්ජාතික මානව හිමිකම් නීතිය –LLU6717/LWU4325

කාලය – පැය 03

දිනය: 2025 මැයි 22 වේලාව: ප.ව. 1.30 – ප.ව. 4.30

මුලු ප්‍රශ්න ගණන – 08
ප්‍රශ්න පහක් (5) සඳහා පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ වර්ධනය කෙරෙහි තීරණාත්මකලෙස බලපෑවේය. සම්මුති පාදක නීති පද්ධතියක් ඇති කිරීම, නීතියේ මෙම අංශය වර්ධනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය දායක වූ ප්‍රධාන ආකාරයක් වේ.

   ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද? ඔබගේ ස්ථාවරය තහවුරු කිරීම සඳහා යෝග්‍ය උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. **(ලකුණු 20)**

2. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපතිවරයෙක් 2017 වර්ෂයේදී ගුරුවරුන් සඳහා පැවැති උත්සවයක දී කරන ලද කථාවෙන් උපුටා ගත් කොටසකි. උපුටනය කියවා, මෙම කථාවේ ඉදිරිපත් වන තර්කය මානව හිමිකම්වල විශ්වීය අදාලත්වය සහ සංස්කෘතික සාපේක්ෂතාවාදය පිලිබඳ වන විවාදයේ පසුබිම තුල විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

   […] මම තෝපාවැව මහා විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ එක දවසක් මගේ පන්ති කාමරයේ විශාල කාලගෝට්ටියක් ඇති වුණා. මේ දිහා බලාගෙන හිටපු විදුහල්පති මාව පැත්තකට අරන් ගිහින්, වේවැල කැඩෙනකම් වේවැල් පහර ගැසුවා … මගේ අම්මා ගුරුවරියක්. මගේ තාත්තා ගම්පති. මම ඒ අයට කීවා නම් මට වේවැල් පහර ගැහුවා කියලා, ඒ අය කියාවී එහෙම දඩුවම් ලබන්න මං මොකක් හරි වරදක් කරලා ඇති, තමුන් වුණත් ඒ විදිහට දඩුවම් දෙන්න ඉඩ තිබුණා කියලා.

   මේ කාලයේ වෙන දේවල් නිසා මං පුදුමයට පත් වෙලා ඉන්නෙ. මානව හිමිකම්, මූලික අයිතිවාසිකම්, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය වගේ ඒවා හොඳ දේවල් තමයි. මේවා තියෙන්නේ සමාජය හොඳ එකක් කරන්න මිස, සමාජය අසරණ කරන්න නෙමෙයි…

ඉස්කෝලෙ ගුරුවරයෙක් ළමයෙක්ගේ කණ මිරිකුවොත්, ටොක්කක් ඇන්නොත්, කම්මුලට පාරක් දුන්නොත් ඒ ගුරුවරයාව පොලිසියට අරගෙන යනවා. එයාට විරුද්ධව නඩු දානවා. ඉස්කෝලෙ යන ළමයින්ගේ දෙමාපියන් මේ නිසා මානව අයිතිවාසිකම්, නිදහස වගේ වචනවල ඇත්ත තේරුම දැනගෙන ඉන්න ඕනෙ'. **(ලකුණු 20)**

3. ඔබගේ පාසැලේ ආදි ශිෂ්‍ය සංගමය 'අන්තර්ජාතික මානව හිමිකම් නීතිය යටතේ කාන්තා අයිතිවාසිකම් සහ ශ්‍රී ලංකාව තුල එහි අදාල වීම' යන මැයෙන් දේශනයක් පැවැත්වීම සඳහා ඔබට ආරාධනා කොට ඇත. සංවිධායකයන් මෙම මාතෘකාව පිලිබඳ විවේචනාත්මක ඇගයුමක් අපේක්ෂා කරති. මෙම කථාව සඳහා දළ සැලැස්මක් පිළියෙල කරන්න. අදාල නෛතික ප්‍රතිපාදන සහ නඩු නීතිය ඔබගේ කථාව තුල අන්තර්ගත විය යුතුය. **(ලකුණු 20)**

4. ජෙනරාල් බෲටස් යනු කැක්ටස් සමූහාණ්ඩුවේ හමුදාපති වේ. සමූහාණ්ඩුවේ රජයට එරෙහිව බෙදුම්වාදී කැරලිකරුවන් පිරිසක් මෙහෙයවන ලද සිවිල් යුද්ධයක දී හමුදාවට නායකත්වය දුන්නේ ඔහුය. යුද්ධයේ අවසාන අවධියේදී, දැඩි ලෙස සිදු වූ බර අවි ප්‍රහාර නිසා X නම් වූ සුළුතර වාර්ගික ප්‍රජාවට අයත් සිවිල් වැසියන් සිය ගණනක් මිය ගිය අතර රෝහල් බඳු අත්‍යවශ්‍ය යටිතල පහසුකම් හානියට පත්විය. තවද, හමුදාව විසින් පහසුකම් සලසන ලද අතුරු සන්නද්ධ කණ්ඩායම් කැරලිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සඳහා රැඳවුම් කඳවුරු පවත්වාගෙන ගියේය. මෙම කඳවුරු තුල වධහිංසා සිදු වූ බවට චෝදනා පවතී. යුද්ධයෙන් පසුව X නම් වූ ප්‍රජාවේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින පිරිස් යුද්ධය තුල අදාල ප්‍රජාවට අත් විඳින්නට සිදු වූ කෲර ක්‍රියා අන්තර්ජාතික අපරාධ අධිකරණය වෙත යොමු කිරීමට අදහස් කරයි.

(අ) අන්තර්ජාතික අපරාධ අධිකරණයට නඩු යොමුවන ආකාරය පැහැදිලි කර බෲටස්ට එරෙහිව අන්තර්ජාතික අපරාධ අධිකරණයේ අභිචෝදනා ගොනු කල හැකිදැ'යි සාකච්ඡා කරන්න. කැක්ටස් සමූහාණ්ඩුව අන්තර්ජාතික අපරාධ අධිකරණයට අදාළ රෝම ප්‍රඥප්තියේ පාර්ශවකාර රාජ්‍යයක් නොවන බවට උපකල්පනය කරන්න.

**(ලකුණු 10)**

(ආ) ජෙනරාල් බෲටස්ට එරෙහිව නඩු පැවරීම සඳහා භාවිතා කළ හැකි වෙනත් විකල්ප පර්ෂද පවතීද? අන්තර්ජාතික අපරාධ නීතියේ වර්ධනයට අදාල ඓතිහාසික උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. **(ලකුණු 10)**

5. (අ) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC), මානව හිමිකම් කමිටුව සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම අතර වෙනස පහදන්න. එක් එක් ආයතනවල කාර්යයන් සංසන්දනය කොට වෙනස්කම් දක්වන්න. **(ලකුණු 10)**

(ආ) පාර්ශවකාර රාජ්‍යයන් සම්මුතීන්වලට අදාලව කටයුතු කරන බවට අධීක්ෂණය කිරීම සඳහා සම්මුති-පාදක යාන්ත්‍රණ (treaty-based mechanisms) කටයුතු කරන්නේ කෙසේදැ'යි පහදන්න. අධීක්ෂණය සඳහා දැනට පවතින යාන්ත්‍රණය මානව හිමිකම් ඵලදායී ලෙස ආරක්ෂාව සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රමාණවත් වන බව ඔබ සිතනවාද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. **(ලකුණු 10)**

6. ළමා අයිතිවාසිකම් සම්මුතිය (Convention on the Rights of the Child) විසින් ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව සහ ප්‍රවර්ධනය සඳහා පරිසමාප්ත රාමුවක් සපයනු ලබයි. ළමා අයිතිවාසිකම් සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව සිය බැඳීම් කෙතරම් දුරට ඉටු කොට තිබේද යන්න විවේචනාත්මකව අගයන්න. ඔබගේ පිළිතුර තුළ අධ්‍යාපනය, ළමා ශ්‍රමය, අපහරණයෙන් ආරක්ෂාව වැනි ඕනෑම ක්ෂේත්‍ර දෙකක් (02) ඔබගේ වරණය පරිදි තෝරාගෙන ඒවාට අදාල නෛතික සංස්ථාපනයන් සහ ප්‍රායෝගික භාවිතාව සාකච්ඡාවට ලක්විය යුතුය.

**(ලකුණු 20)**

7. [...] ආගම සහ මානව හිමිකම් යනු අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධයක් නොමැති දේවල් වෙති. සමාජයක් ආගමික වන තරමට, මානව හිමිකම් ආරක්ෂාව සඳහා තිබෙන ඉඩකඩ හීන වෙයි'. ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඓතිහාසික හා සමකාලීන සිදුවීම් ඇසුරින් නිසි උදාහරණ දෙමින්, ඔබගේ තර්ක ඉදිරිපත් කරන්න. **(ලකුණු 20)**

8. පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   a) එක්සත් ජාතීන්ගේ තත්කාර්යමය අධිකරණ පර්ෂද (UN *ad hoc* tribunals)
   b) ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්
   c) තනි පුද්ගල පැමිණිලි යාන්ත්‍රණ
   d) ජීවිතය සඳහා ඇති අයිතිය **(ලකුණු 5 X 4 = ලකුණු 20)**

*-හිමිකම් ඇවිරිණි-*